# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1791/28 - 2013 ජනවාරි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2013.01.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

ඉස්සන් බෝකිරීමේ හා පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ඉස්සන් බෝකිරීමේ හා පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරනු ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමැතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ඉස්සන් බෝ කිරීමේ සහ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, 1999 අප්‍රේල් මස 04 වැනි දින අංක 1073/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයෙහි වූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, අවසන් වරට 2010 ජූලි මස 30 වැනි දින අංක 1664/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ උපලේඛනයට පහත සඳහන් කොටස ඇතුළත් කිරීමෙන් වෙනස් කළ යුතු ය.

ඉස්සන් බෝකිරීමේ සහ පිටරට යැවීමේ කර්මාන්තයෙහි නියුක්ත I වන කොටසේ සඳහන් විවිධ ශ්‍රේණි යටතේ දැක්වෙන කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම මාසික ඒකාබද්ධ වේතන ප්‍රමාණය II කොටසෙහි එම ශ්‍රේණියට අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතු ය.

1A - G 17060 - 360 (2013/01)

*I වන කොටස*

*සේවකයන්ගේ පන්තිය*

*පුහුණු :*

මේසන්වරු, වඩුවෝ, ජලය සපයන්නෝ සහ ටැංකිවලින් ජලය පිට කරන්නෝ, පොම්පාගාර පාලකයෝ සහ පොම්පකරුවෝ, ජලය සංසරණය සිදුකරන්නෝ, ඔක්සිජන් සපයන්නෝ, උෂ්ණත්වය පාලනය කරන්නෝ, කෑම විටමින් වර්ග සහ ඖෂධ සපයන්නෝ, සත්ත්ව ආහාර නිකුත් කරන කම්කරුවන්/ගබඩා කරුවෝ, අස්වැන්න බාර ගන්නා අය ගබඩා කරුවෝ, හරි වැරදි බලන්නෝ හා තත්ත්ව පාලකවරු, කපන්නෝ, සෝදන්නෝ, ඉස්සන් වර්ග කරන්නෝ, හරි වැරදි බලන්නෝ, ටැංකි සෑදීමේ යෙදෙන කම්කරුවෝ, අස්වැන්න එකතු කරන්නෝ, බෝට්ටු පදවන්නෝ, පැකට්වලට අසුරන්නෝ, ශීත කාමරවල තැන්පත් කරන්නෝ.

*අර්ධ පුහුණු :*

භූමිය සකස් කරන කම්කරුවෝ, ටැංකි මුරකරුවෝ සහ භාරකරුවෝ, ලණු ඇඹීම කරන්නෝ, මුද්‍රා තබන්නෝ, සෙලෝපේන් සහ කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, ගල්වැටි දැමීම සහ අඩි පාරවල් සාදන්නෝ.

*නුපුහුණු :*

ටැංකි පවිත්‍රකරන්නෝ, ටැංකි සතුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා නියැලෙන කම්කරුවෝ, ශීත කාමර ශුද්ධ කරන්නෝ සහ අමදින්නෝ,

ඉහත දැක්වෙන ඡේදවල ඇති වැඩවලට සම්බන්ධ වූ හෝ අනියම් වශයෙන් ගැනෙන යම් කාර්යයක නිරත වූ කම්කරුවෝ.

පහත සඳහන් සේවකයන් මෙම පඩිපාලක සහා තීරණවලින් අවාරණය නොවේ :-

1. 1945 නොවැම්බර් මස 02 වැනි දින අංක 9481 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ ආඥාවෙහි නියමිත මෝටර් රථ ගමනාගමන කර්මාන්තයේ නියුක්ත කම්කරුවෝ - ඒ කර්මාන්තයේ නිර්දේශිත අනුව වරප්‍රසාද හා ගෙවීම් ලැබිය යුතු යි.

2. 1944 ජනවාරි මස 07 වැනි දින අංක 9224 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ සහ අනතුරුව සංශෝධනය කරන ලද ආඥාවෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයේ නියුක්ත කම්කරුවෝ - ඒ කර්මාන්තයේ නිර්දේශිත වරප්‍රසාද හා ගෙවීම් ලැබිය යුතු ය.

3. ලිපිකරුවෝ, කැෂියර්වරු, වේලා සටහන්කරුවෝ, මුරකරුවෝ

*II කොටස*

*වැඩ කරන මාසයක් සඳහා වූ අවම වේතන ප්‍රමාණය*

| *සේවා වසර* | *පුහුණු රු. ශ.* | *අර්ධ පුහුණු රු. ශ.* | *නුපුහුණු රු. ශ.* |
|---|---|---|---|
| 1 වසර | 10,400 00 | 9,920 00 | 9,500 00 |
| 2 වසර | 10,550 00 | 10,045 00 | 9,600 00 |
| 3 වසර | 10,700 00 | 10,170 00 | 9,700 00 |
| 4 වසර | 10,850 00 | 10,295 00 | 9,800 00 |
| 5 වසර | 11,000 00 | 10,420 00 | 9,900 00 |

01 - 492

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.